සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව

නම/විභාග අංකය :- ........................................................... කාලය: පැය 02 යි.

### I කොටස

- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

---

- 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුලින් තෝරා හිස්තැන සම්පූර්ණ කරන්න.

(01) ශ්‍රී ලංකාවේ කුඩාම පරිපාලන ඒකකය .................................................... යි. (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස/ පළාත/ ග්‍රාම නිලධාරී කොට්ඨාසය)

(02) උතුරු දිශාව හා නැගෙනහිර දිශාව අතර .................................................... දිශාව පිහිටා ඇත. (මධ්‍යම / නැගෙනහිර/ ඊසාන)

(03) සුළඟේ වේගය මනිනු ලබන්නේ .................................................... වලිනි. (පැයට සැතපුම්/ පැයට කිලෝමීටර්/ මිලි මීටර්)

(04) යම්කිසි රටක අවට පිහිටි රටවල් මුහුදු හා සාගරවල පිහිටීම සම්බන්ධ කරමින් ................................................පිහිටීම ගත හැකිය. (නිරපේක්ෂ/ සාපේක්ෂ/ මධ්‍යස්ථ)

(05) ගස්වල බීජ ව්‍යාප්තියට ................................................සහය වෙයි. (ගිරවා/ වේයා/ වවුලා)

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් '✓' ලකුණ ද වැරදි නම් '×' ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

(06) ග්‍රීන්ලන්තය ලෝකයේ පිහිටි විශාලතම ද්වීපයයි. ( )

(07) වායුගෝලයේ පවත්නා වායු වර්ග අතුරින් ශාක වර්ධනයට අවශ්‍ය වන්නේ නයිට්‍රජන් වායුවයි. ( )

(08) කඳුකර ප්‍රදේශවල වී වගාව පහසුවෙන් සිදුකළ හැකි වේ. ( )

(09) මොනරා සංචාරක පක්ෂියෙකි. ( )

(10) දිරාපත් නොවන ද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම හානිකරය. ( )

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ආකාරයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට ඇති අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියන්න.**

(11) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන මුහුදු තීරය වන්නේ,

(1)අරාබි මුහුද (2) බෙංගාල බොක්ක

(3)පෝක් සමුද්‍ර සන්ධිය (4) මලක්කා සමුද්‍ර සන්ධිය ................

(12) වේවැල් භාණ්ඩ සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශයක් වන්නේ,

(1)මොරටුව (2) අම්බලන්ගොඩ

(3)රදාවඩුන්න (4) දුම්බර ................

(13) ෆැරන්හයිට් හා සෙල්සියස් යන ඒකක වලින් මනිනු ලබන්නේ,

(1)වර්ෂාපතනය (2) උෂ්ණත්වය

(3)ආර්ද්‍රතාව (4) උස ................

(14) කොළඹ දිස්ත්‍රික්කය අයත් පළාත කුමක් ද?

(1)බස්නාහිර (2) දකුණ

(3)ඌව (4) නැගෙනහිර ................

(15) භූමිය අයහපත් ලෙස පරිහරණය කිරීම නිසා ඇති වන අයහපත් ප්‍රතිඵලයකි.

(1)සුනාමි (2) භූමි කම්පා

(3)නියඟ (4) නායයෑම් ................

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) බෝග වගා කිරීම, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය යනාදිය අයත් වන්නේ ........................................................ කටයුතු වලටයි.

(17) නිවැරදිව දිශාව හඳුනා ගැනීම සඳහා ........................................................................................ යන්ත්‍රය භාවිත කෙරේ.

(18) ජල වාෂ්ප .......................................................................... වීමෙන් වළාකුළු නිර්මාණය වේ.

(19) වළං,උළු හා ගඩොල් වැනි නිෂ්පාදන යොදා ගනු ලබන අමු ද්‍රව්‍ය වන්නේ ..............................................................ය.


(20) අතීත වාරි ශිෂ්ටාචාරයේ කේන්ද්‍රස්ථානය ..............................................................................යි.

(ලකුණු 2×20= 40)

## II කොටස

- **මෙහි පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු සැපයිය යුතුය.**
- **ප්‍රශ්න අංක 02 සිට 07 තෙක් ඇති ප්‍රශ්නවලින් ප්‍රශ්න හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

(01) (අ) දී ඇති ලංකා සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.





(i) ඔබගේ පාසල අයත් වන දිස්ත්‍රික්කය සේයා කර දක්වන්න. (ලකුණු 01)

(ii) ඔබගේ පාසල අයත් වන දිස්ත්‍රික්කයට යාබද දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iii) සිතියමේ සේයා කොට දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ප්‍රමාණයක් අයත් පළාතයි. එය නම් කරන්න. (ලකුණු 01)

(iv) A හා B අක්ෂර වලින් දක්වා ඇති සබරගමු පලාතට අයත් දිස්ත්‍රික්ක දෙක පිලිවෙලින් නම් කරන්න. (ලකුණු 01)

(ආ) දී ඇති ලෝක සිතියම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ශ්‍රී ලංකාව දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(ii) ශ්‍රී ලංකාවට බටහිරින් පිහිටි මහද්වීපය නම් කරන්න.

(iii) කියුබාව දක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

(iv) ඔස්ට්‍රේලියාව පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවට කුමන දිශාවෙන් ද?


(v) D අක්ෂරයෙන් දක්වා ඇති සාගරය කුමක් ද?

(vi) ශ්‍රී ලංකාව අයත් වන මහද්වීමපය කුමක් ද?

(ලකුණු 1×6=06)

(02) (i) පළාත දිස්ත්‍රික්කය හා පාසලේ නම යොදා ගනිමින් ඔබේ පාසලේ අනන්‍යතාව ලියා දක්වන්න. (ලකුණු 02)

(ii) පහත දැක්වෙන ආකෘතිය ඇසුරින් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




(a) පාසලට ඊසාන දිසාවෙන් පිහිටා ඇත්තේ කුමක් ද?

(b) පිට්ටනිය පිහිටා ඇත්තේ පාසලේ සිට කුමන දිශාවෙන් ද?

(c) පාසලට උතුරින් පිහිටා ඇත්තේ කුමක් ද?

(d) තැපැල් කාර්යාලය පිහිටා ඇත්තේ පාසලට කුමන දිශාවෙන් ද?

(e) පාසල පිහිටා ඇත්තේ සිතියමේ කුමන ස්ථානයක ද? (ලකුණු 2×5 = 10)

(03) (i) කාලගුණය යනු කුමක් ද? කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු = 02)

(ii) (a) කාලගුණික අංග දෙකක් නම් කරන්න.

(b) ඔබ සඳහන් කල එම අංග දෙක මනිනු ලබන උපකරණ පිළිවෙලින් නම් කරන්න. (ලකුණු = 02)

(iii) ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව පිහිටි ස්ථානය සඳහන් කරන්න. (ලකුණු = 02)

(iv) කාලගුණ තොරතුරු දැන ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු = 04)

(04) (i) ශ්‍රී ලංකාවේ සංචාරක පක්ෂීන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු = 02)

(ii) ශාකවලින් ,

(a) මිනිසාට ලැබෙන ප්‍රයෝජන හතරක් ද

(b) සතුන්ට ලැබෙන ප්‍රයොජනයක් ද දක්වන්න. (ලකුණු 05)

(iii) පහත සඳහන් සතුන්ගෙන් පරිසරයට ලැබෙන ප්‍රයෝජනයක් බැගින් සඳහන් කරන්න.

(a) ගැඩවිල් පනුවා

(b) වේයා

(c) ඇටි කුකුළා

(d) කපුටා

(e) බත් කූරා (ලකුණු 05)

(05) (i) භූමියේ ස්වභාවය අනුව පහත සඳහන් ප්‍රදේශවල වගා කරනු ලබන බෝග වර්ග එක බැගින් නම් කරන්න.

(a) තැනිතලා ප්‍රදේශ

(b) ගංගා නිම්න ප්‍රදේශ

(c) කඳුකර ප්‍රදේශ (ලකුණු 1×3= 03)

(ii) පාරම්පරික ශිල්ප ඥානය මත පදනම් වී ඇති පහත කර්මාන්ත සඳහා ප්‍රසිද්ධ ස්ථාන නම් කරන්න.

(a) ලී බඩු

(b) පිත්තල භාණ්ඩ

(c) වෙස් මුහුණු

(d) පැදුරු (ලකුණු = 04)

(iii) (a) රජයෙන් නොමිලේ සැපයෙන සේවාවන් දෙකක් සඳහන් කරන්න.

(b) එම සේවාවන් දැක්වීමේ දී ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් තුනක් ලියන්න. (ලකුණු = 03)

(06) (i) භූමිය සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගන්නා ආකාර තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) අවිධිමත් භූමි පරිහරණය සඳහා හේතුවන මිනිස් ක්‍රියාකාරකම් තුනක් කෙටියෙන් පහදන්න.
(ලකුණු = 04)

(iii) (a) ජලය හිඟ වීමෙන් ඇති වන ගැටලු තුනක් සඳහන් කරන්න. (ලකුණු = 03)

(b) අවිධිමත් ජල පරිභෝජනය වලක්වාලීමට ඔබට අනුගමනය කල හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු = 03)

(07) (i) සියළු බලශක්ති ප්‍රභවයන්ගේ මූලය ලෙස සැලකෙන්නේ කුමක් ද? (ලකුණු = 02)

(ii) ඔබගේ නිවසේ විවිධ කාර්යයන් සඳහා භාවිත කරන බලශක්ති ප්‍රභවයන් තුනක් නම් කරන්න.
(ලකුණු = 03)

(iii) (a) වර්තමානයේ බලශක්ති ඉල්ලුම ඉහළ යාමට හේතු තුනක් දක්වන්න. (ලකුණු = 03)

(b) නිවසේ විදුලිය පරිහරණයේ දී නාස්තිය අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු = 04)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 06 - ශ්‍රේණිය

## භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | ග්‍රාම නිලධාරි කොට්ඨාසය | (06) | ✓ | (11) | පොක් සමුද්‍ර සන්ධිය | (16) | කෘෂිකාර්මික |
| (02) | ඊසාන | (07) | ✓ | (12) | රදාවඩුන්න | (17) | මාලිමා යන්ත්‍රය |
| (03) | පැයට කිලෝමීටර් | (08) | × | (13) | උෂ්ණත්වය | (18) | ඝනීභවනය |
| (04) | සාපේක්ෂ | (09) | × | (14) | බස්නාහිර | (19) | මැටි |
| (05) | වවුලා | (10) | ✓ | (15) | නායයෑම් | (20) | අනුරාධපුරය |

### II පත්‍රය

(01) (අ) (i),(ii)නියමිත පරිදි සේයා කොට නම් කොට ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(iii) උතුරු පළාත

(iv) රත්නපුරය, කෑගල්ල

(ආ) (i) A

(ii) අප්‍රිකා

(iii) C

(iv) ගිණිකොණ

(v) ආසියා

(02) (i) නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(a) බැංකුව

(b) බටහිර

(c) රෝහල

(d) නිරිත

(e) මධ්‍යයේ

(03) (i) යම්කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ පවතින වායුගෝලයේ ස්වභාවය කාලගුණය යනුවෙන් හැඳින්වේ.

(ii) (a) උෂ්ණත්වය, වර්ෂාපතනය, සුළං, වලාකුළු

(b) උෂ්ණත්වය - උෂ්ණත්වමානය

වර්ෂාපතනය - වර්ෂාමනාය

සුළගේ වේගය - අනිලමානය

සුළං දිශාව - සුළං දිශා දර්ශකය

වලාකුළු - නිරීක්ෂණය මගින්

(iii) බෞද්ධාලෝක මාවත කොළඹ

(iv)
- එදිනෙදා කටයුතු මනාව සංවිධානය කර ගැනීමට
- ජීවිත දේපල හානි වලක්වා ගැනීමට
- ධීවරයන්ට හා ගොවීන්ට හා නාවිකයන්ට තමන්ගේ කටයුතු සාර්ථක කර ගැනීමට

(04) (i) සිවුරු හොරා, සුදු රෙදි හොරා, අවිච්චියා

(ii) (a) මිනිසාට - ආහාර ඖෂධ ලබා දීම
- ඉන්ධන ලබා දීම
- ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට ද්‍රව්‍ය ලබා දීම
- සිසිලස ලබා දීම
- ගොඩනැගිලි ඉදි කිරීමට අවශ්‍ය දුව ලබාදීම

සතුන්ට - ආහාර හා නිවාස සැපයීම

(iii) (a) ගැඩවිල් පනුවා - පස බුරුල් කිරීමට හා පස සරු කිරීමට
(b) වේයා - විවිධ අපද්‍රව්‍ය කැබලිකොට දිරාපත් වීමට උදව් කිරීම
(c) ඇටි කුකුළා - ගොළුබෙල්ලන් විනාශ කිරීම
(d) කපුටා - කුණු කසල කා දැමීම
(e) බත් කුරා - කුඹුරු වලට හානි කරන කෘමීන් විනාශ කිරීම

(05) (i) (a) තැනිතලා - පොල් වගාව
(b) ගංගා නිම්න ප්‍රදේශ - වී වගාව
(c) කඳුකර ප්‍රදේශ - තේ හා රබර් වගාව

(ii) (a) ලී බඩු - මොරටුව
(b) පිත්තල භාණ්ඩ - පිළිමතලාව
(c) අම්බලන්ගොඩ
(d) දුම්බර

(iii) (a) සෞඛ්‍ය / අධ්‍යාපන
(b) අදාල පරිදි ගලපා ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(06) (i) පදිංචියට
- කෘෂිකර්මාන්තයට, කර්මාන්තශාලා ඉදි කිරීම, වාරි මාර්ග සඳහා, මාර්ග ඉදි කිරීමට ආදී.......

(ii)
- කඳු බෑවුම් වල වගා කිරීම
- මහා පරිමාණයෙන් කෘෂි බිම් ව්‍යාප්ත කිරීම
- කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිත කිරීම
- වැලි ගොඩ දැමීම / හුණුගල් කැඩීම ආදී.........

(iii) (a)
- පානීය ජලය හිඟ වීම
- ජීවීන්ගේ පැවැත්මට තර්ජනයක් වීම
- ලෙඩ රෝග ව්‍යාප්ත වීම
- පස නිසරු වීම
- ජල විදුලි බල නිෂ්පාදනය අඩාල වීම

(b) ක්‍රියාමාර්ග නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(07) (i) සූර්යයා

(ii) දර, ගෑස්, ජීවවායු, කපුරු, ඩීසල්, ජල විදුලි බලය ආදී ලෙස නිවැරදි බලශක්ති පදනම සඳහා ලකුණු ලබා දෙන්න.

(iii) (a)
- ජන සංඛ්‍යාව වැඩිවීම
- පාරිභෝගික අවශ්‍යතාව ඉහළ යාම
- කාර්මික කටයුතු වල වර්ධනය
- ප්‍රවාහන දියුණුව
- ජීවන තත්ත්වය උසස්වීම

(b) නිවැරදි කරුණු ගලපා ඇත්නම් ලකුණු ලබා දෙන්න.